## සමෘද්ධි බැංකු සංගම් හා මහ සංගම් වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන

## පිළියෙල කිරීම - 2013

**ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරනු ලබන බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 34 ට පස්වනඑකතුව**

1. පාලක මණ්ඩලය,
   සමෘද්ධි බැංකු සංගමය, ..............................
2. කළමනාකරු,
   සමෘද්ධි බැංකු සංගමය, ..............................
3. සභාපති,විධායක කමිටුව,
   සමෘද්ධි මහ සංගමය, ............................
4. කළමනාකාර අධ්‍යක්ෂ,
   සමෘද්ධි මහ සංගමය, ......................................
5. මූලස්ථාන කළමනාකරු,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ......................................
6. ප්‍රාදේශිය ලේකම්/ නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, .....................................
7. සමෘද්ධි සහකාර කොමසාරිස්/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ......................................
8. සමෘද්ධි සම්බන්ධිකරණ නිලධාරි,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ......................................
9. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ......................................
10. ප්‍රධාන අභ්‍යන්තර විගණක,
    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.
11. සාමාන්‍යාධිකාරි සහ සියළුම අධ්‍යක්ෂවරු,
    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.
12. ලේකම්,
    ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
    5 වන මහල,අංක 464, ටී.බී. ජායා මාවත,
    කොළඹ 10.

**බැංකු මූල්‍ය කටයුතු අංශය,ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය,**

**4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**

**2013.12.17**

දුරකථන අංකය:- 0112 - 873798 ෆැක්ස් අංකය :- 0112 - 869494

2013.12.17

**ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරනු ලබන බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 34 ට පස්වන එකතුව**

# <u>සමෘද්ධි බැංකු සංගම් හා මහ සංගම් වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම - 2013</u>

**1. හැදින්වීම.**

1.1 සමෘද්ධි බැංකු හා මහ සංගම්වල වර්ෂ අවසාන ගිණුම් පියවීමේ කටයුතු මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 12 හා ඊට එකතුන් හි සදහන් උපදෙස් හා ක්‍රියා පිළිවෙත් අනුව සිදු කළ යුතුය. එම කාර්ය තවදුරටත් කාර්යක්ෂමව හා නිරවද්‍යව සිදු කිරිමට අවශ්‍ය මගපෙන්වීම් කිරිම මෙම නව නිකුතුව මගින් සිදුවේ.

1.2 සමෘද්ධි බැංකු සංගම් හා මහ සංගම් බැංකු කළමනාකරු/ කළමනාකාර අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩල විසින් මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 12 හා ඊට එකතුන් හි පරිදි වර්ෂ අවසාන ගිණුම් පියවීම් හා මූල්‍ය ප්‍රකාශන සකස් කිරිම සිදු කිරිමේදි ඒ සදහා මෙම නව එකතුවේ සදහන් උපදෙස් හා ගණනය කිරිම් ද ඇතුලත් වන පරිදි කටයුතු සිදු කිරිම කළ යුතුය.

**2. සමෘද්ධි බැංකු සාමාජිකයින්, සම්පුර්ණ කරන ලද සාමාජික කොටස් සදහා ලාභාංශ හෝ කොටස් පොලිය ලබාදීම.**

2.1 2013 වසර තුල, පසුගිය වසරක හෝ වසර කිහිපයකට අදාල මූල්‍ය ප්‍රකාශනයක් අනුමත වී ඇත්නම් එය මහ සභාවේ සම්මතවීමෙන් පසු ඒ මත පදනම් 2013 වර්ෂය සඳහා ලාභාංශ ප්‍රකාශයට පත් කළ හැකිය.

2.2 2013 වර්ෂය තුළ කිසිදු මූල්‍ය ප්‍රකාශනයක් අනුමත වී නොතිබුණ ද, පසුගිය වර්ෂ වල අනුමත වී ඇති මූල්‍ය ප්‍රකාශන අනුව කොටස් කරුවන්ට ගෙවිය යුතු ලාභාංශ ගිණුමේ 2013 වර්ෂය සඳහා ලාභාංශයක් ප්‍රකාශ කිරීමට <u>ප්‍රමාණවත් අනුමත වූ ශේෂයක් ඉතිරිව ඇත්නම්</u>මහ සභාවේ සම්මතවීමෙන් පසු ලාභාංශ ප්‍රකාශයට පත් කළ හැකිය.

2.3 ඉහත 01 හා 02 පරිදි ක්‍රියා කරන බැංකු සංගම් හැර අනෙකුත් සියළුම සමෘද්ධි බැංකු සංගම් 2013 ජනවාරි 01 දිනට සම්පුර්ණ කරන ලද කොටස් සදහා 5% වාර්ෂික පොලියක් ගෙවිය යුතුය. මේ සම්බන්ධව මෙහෙයුම් උපදෙස් අංක 06 හි ජේද අංක 13.3 හි පරිදි කටයුතු සිදු කළ යුතුය.

2.4 2013 වසර සඳහා ද අනිවාර්ය ඉතිරි කිරීම් තැන්පතු සඳහා වර්ෂික 5% පොලී අනුපාතයක් තැන්පත් කරුවන්ට ලබාදිය යුතුය. අනිකුත් තැන්පතු සඳහා ද දැනට බලපවත්වන පොලී අනුපාතයන් නොවෙනස්ව පවති.

**3. බැංකු මුලා කටයුතු අංශයෙන් ඉල්ලීම් කර ලබාගත්/ නොලැබුනු සහන පොලී මුදල් ගිණුම්ගත කිරීම.**

3.1 මිහිජය ණය ඇතුළු අනිකුත් ණය සඳහා 4% හා 2% සහන පොලී මුදල් බැංකු සංගම්වලට දැනට ලැබී ඇත්නම් ආදායමට එකතු කර ගැනිමට ගිණුම් සටහන් තැබිය යුතුය.

3.2 බැංකු මුලා කටයුතු අංශයෙන් නියමිත උපදෙස් පරිදි ඉල්ලීම් කර, මෙතෙක් බැංකු සංගම්වලට පොලී මුදල් ලැබී නොමැතිවිටක මෙහෙයුම් උපදෙස් 20 ට හතරවන එකතුවේ ජේද අංක 04 ට අනුව ගිණුම් සටහන් තබා ආදායමට එකතු කරගත යුතුය.

**4. සමෘද්ධි බැංකු සංගම් හා මහ සංගම් කාර්ය මණ්ඩල සඳහා සමෘද්ධි අධිකාරිය දරණ ලද වැටුප්, ගමන් වියදම් ඇතුළු අනිකුත් වියදම් ගැලපීම.**

4.1 මෙහෙයුම් උපදෙස් 12 ට පස්වන එකතුවේ සඳහන් පරිදි 2013 වසරට තුල සමෘද්ධි බැංකු/ මහ සංගම් නිත්‍ය කාර්ය මණ්ඩල වෙනුවෙන් සමෘද්ධි අධිකාරිය දරණ ලද වැටුප් හා ගමන් වියදම් සත්‍ය ලෙස ගණනය කර, වැටුප් හා ගමන් වියදම් ගිණුම්වලට හර කළ යුතුය.

4.2 කාර්ය මණ්ඩල වැටුප් ගණනයේදී, පහත කරුනු කෙරෙහි ඔබගේ අවධානය යොමු කළ යුතුය.

4.2.1 වර්ෂය පුරා, යම් නිලධාරියකු සේවයට අනුයුක්ත නොවු විටක, රාජකාරි කාලයට ලබාගත් වැටුප පමණක් වැටුපට එකතු කළ යුතුය.

4.2.2 වැටුප් සහිත අනුමත නිවාඩු සිටින නිලධාරියෙකුගේ වැටුප, වැටුප් ගණනයේදී ඇතුලත් කළ යුතුය.

4.2.3 වැඩ බලන නිලධාරියෙකු, බැංකු සංගමයේ/ මහ සංගමයට අනුයුක්ත වී සිටින අවස්ථාවලදී, දිනක හෝ මාසයක වැඩිම රාජකාරි කාලයක් බැංකු සංගමය/ මහ සංගමයට යොදන නිලධාරින්ගේ වැටුප වැටුප් ගණනයේදී වැටුප් වියදමට හර කළ යුතුය.

4.3 කාර්ය මණ්ඩල වැටුප් ගණනය කිරීමේදී එක් එක් නිලධාරියාගේ මාසික දළ වැටුපට රජය විසින් දරන ලද 12% EPF හා 3% ETF මුදල් ද එකතු කරගෙන, එක් එක් මාසවලට අදාල වැටුප් ප්‍රමාණයන් ගණනය කළ යුතුය. මෙහිදි කිසිදු බැංකු සංගමයකට හෝ මහ සංගමයකට කාර්ය මණ්ඩල වැටුප් වියදම ඇතුලත් නොකර වාර්ෂික ලාභ අලාභ ගිණුම සකස් කිරීමට අවසරයක් නොමැති බව අවධාරණය කරමු.

4.4 කාර්ය මණ්ඩල ගමන් වියදම්, වාර්ෂික වියදමක් ලෙස ගණනය කිරීමේදි, එක් එක් නිලධාරියා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ මුදල් ප්‍රතිපාදන යටතේ ඉල්ලීම් කර

2013 වසර තුල සත්‍ය වශයෙන් ලබාගත් මුදල පමණක් ඇතුලත් කිරිමට වගබලා ගත යුතුය. මේ දක්වා ඉල්ලීම් කර නොලැබුනු ගමන් වියදම් ඇතුලත් නොකළ යුතුය.

4.5 ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, සමෘද්ධි බැංකු සංගම් කටයුතු වෙනුවෙන් කාර්ය මණ්ඩල වැටුප් හා ගමන් වියදම්වලට අමතරව බොහෝ වියදම් දරයි. නමුත් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය ගත් ප්‍රතිපත්ති තිරණයක්මත බැංකු සංගම් හා මහ සංගම් විගණන හා විමර්ශන කටයුතු වෙනුවෙන්, බැංකු මූල්‍ය කටයුතු අංශයේ වියදමින් අදාල විගණන නිලධාරින්ට ගෙවන ගමන් වියදම් පමණක් බැංකු සංගම් හා මහ සංගම් අතරේ සමානුපාතිකව බෙදා හරිනු ලැබේ. ඒ අනුව එක් එක් සමෘද්ධි බැංකු/ මහ සංගමය මෙම වසරට රු. 5,357/- මුදලක් විගණන හා විමර්ශන ගාස්තු ගිණුමට හර කළ යුතුය. ඒ සඳහා ප්‍රවේශන පහත පරිදිවේ.

හර - වැය ගිණුම විගණන හා විමර්ශන ගාස්තු (කේත අංක 2136)

බැර - ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් දරන ලද වියදම් සඳහා වෙන් කිරිමේ ගිණුම.

(කේත අංක 4033)

**5. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලද සමෘද්ධි සහනාධාර මුදල් ගිණුම්ගත කිරිම.**

5.1 සමෘද්ධි සහනාධාර අරමුදලින් අනිවාර්ය ඉතිරි කිරිම් ගිණුම්වලට බැර කළ යුතු අරමුදල් ගිනුමේ ශේෂයක් පවතින බැංකු සංගම් කඩිනමින් එම ශේෂයන් අදාල ගිණුම් හිමියන්ගේ ගිණුම්වලට බැර කළ යුතුය. තවදුරටත් එම ගිණුමේ ශේෂයක් පවත්වාගෙනයාම, 2013 වසර තුල සකස් කරන මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යභාවය පළුදුවීමට හේතුවේ.

5.2 සමෘද්ධි සහනාධාර අරමුදලින් ගණුදෙනුකරුවන්ගේ තැන්පතු ගිණුම්වලට බැර කළ යුතු අරමුදල් ගිණුමෙහි, සාමාජිකයන්ගේ සාමාජික ගිණුම්වලට බැර කිරිමට රැස් කරන ලද අරමුදල් පවතින විටක, බැංකු සංගම් කඩිනමින් වැඩසටහන් සකස් කර, එම අරමුදල් ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුය.

5.3 ඉහත වැඩසටහන්වලට අමතරව 2012 මාර්තු මාසයට පෙර ලද සමෘද්ධි සහනාධාර අරමුදල් හා අනිවාර්ය ඉතිරි කිරිම් අරමුදල් වලින් මෙතෙක් අදාල ප්‍රතිලාභින්ගේ ගිණුම්වලට බැර නොකළ මුදල් ඇත්නම් කඩිනමින් අදාල ගිණුම්වලට බැර කිරිමට කටයුතු කළ යුතුය.

**6. ශේෂ පිරික්සුම් තුලනය කිරීම.**

සියළුම සමෘද්ධි බැංකු සංගම් හා සියළුම සමෘද්ධි මහ සංගම් ශේෂ පිරික්සුම් තුලනය කිරීමේ කටයුතු බැංකු මූල්‍ය හා මහ සංගම් අංශය විසින් නිකුත් කර ඇති මෙහෙයුම් උපදෙස් හා චක්‍රලේඛ ලිපි අනුව සිදුකිරීමට ක්‍රියාකළ යුතුය.

**7. අනිවාර්ය ඉතිරි කිරිම් ආයෝජන අරමුදල් සඳහා පොලි ලබාදීම.**

7.1 2012 මාර්තු මස දක්වා සමෘද්ධි බැංකු සංගම් විසින් බැංකු මූලා කටයුතු අංශයට එවන ලද අනිවාර්ය ඉතිරි කිරීම් ආයෝජන අරමුදල් සඳහා නියමිත පොලී මුදල එවීම සඳහා බැංකු මූලා අංශය කටයුතු කෙරේ.

7.2 සමෘද්ධි මහ සංගම් හරහා අදාල පොලි මුදල් ප්‍රේෂණය කිරිම සිදුවන අතර, යම් කිසි නොවැලැක්විය හේතුවක් මත නියමිත පොලි මුදල සමෘද්ධි මහ සංගම් ජංගම ගිණුම්වලට බැර නොවුනු විටක, නමුත්ම පොලි මුදල් සම්බන්ධ තොරතුරු සමෘද්ධි බැංකු සංගමයට ලැබි ඇති විටක ලැබිය යුතුපොලි ආදායම සඳහා ගිණුම් සටහන් තබාගැනීමට ඉඩදෙනු ලැබේ. ඒ සඳහා ගිණුම් සටහන පහත පරිදිවේ.

හර - සමෘද්ධි අධිකාරියෙන් ප්‍රතිපූර්ණ කළ යුතු අරමුදල් ගිණුම - (කේත අංක 3309)

(සත්‍ය වශයෙන් ලැබෙන ශුද්ධ පොලි මුදල)

හර - වැය ගිණුම - බැංකු ප්‍රවර්ධන කටයුතු - (කේත අංක 2134)

(ප්‍රචාරණ කටයුතු සඳහා රදවාගත් මුදල්)

බැර - ලද පොලි - අනිවාර්ය ඉතිරි කිරිම් ගිණුම - (කේත අංක 1008)

(වසරට අදාල මුළු අනිවාර්ය ඉතිරි කිරිම් පොලි මුදල)

7.3 අදාල පොලි ආදායම, මහ සංගම් ජංගම ගිණුමට බැර වී අදාල නිවේදනය බැංකු සංගමය ලද විටක පහත ගිණුම් සටහන් තබමින්, නිශ්චිත පොලි ආදායම ගිණුම්වලට ගත යුතුය.

හර - ජංගම ගිණුම/ ආයෝජන සඳහා සමෘද්ධි මහ සංගමයට යවන ලද

අරමුදල් ගිණුම.

බැර - සමෘද්ධි අධිකාරියෙන් ප්‍රතිපූර්ණය කළ යුතු අරමුදල් ගිණුම.

එසැනින් අදාල ලෙජර් හෝ රෙජිස්තරවලට සටහන් තැබීමට වගබලා ගත යුතුය.

## 8. සමෘද්ධි බැංකු සංගම්/ මහ සංගම් විසින් කරන ලද ආයෝජනවල ශේෂ තහවුරු ලබාගැනිම.

8.1 සමෘද්ධි මහ සංගම් කළමනාකාර අධ්‍යක්ෂ විසින් 2014 ජනවාරි 10 දිනට පෙර රාජ්‍ය බැංකු ආයතනවල ආයෝජනය කර ඇති අරමුදල් වලින්, කල් නොපිරුණු අරමුදල් පිළිබඳ ශේෂ තහවුරුවක් ලබාගෙන ආයෝජන ශේෂයන්වල නිරවද්‍යතාවය තහවුරු කළ යුතුය. එම ශේෂ තහවුරු ලිපි සුරක්ෂිතව ගොනු කළ යුතුය.

8.2 සමෘද්ධි බැංකු සංගම් විසින් ද, ලිඛිතව මහ සංගමයේ කරන ලද ආයෝජන පිළිබද ශේෂ තහවුරුවක් කඩිනමින් ලබාගෙන අරමුදල් ආයෝජනවල නිවැරදි බව තහවුරු කරගත යුතුය. එම ශේෂ තහවුරු සුරක්ෂිතව ගොනු කළ යුතුය. සමෘද්ධි මහ සංගම්, බැංකු සංගම්වලට අදාල ශේෂ තහවුරු ලිපි ලබාදීමට බැදි සිටියි.

8.3 ශේෂ පිරික්සුම් තුලනය නොවන බැංකු සංගම් වල 2013.12.31 දිනට ණයකරුවන්ගේ සහ තැන්පතු ගිණුම් වල ශේෂ තහවුරු කිරීමක් ලබාගෙන වාර්ෂික ගිණුම් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

**9. වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන සකස් කිරිම.**

9.1 2013වර්ෂයට අදාල පහත ප්‍රකාශන බැංකු සංගම් හා මහ සංගම් විසින් සකස් කිරිම කළ යුතුය. (හදුන්වා දී ඇති ආකෘතින්ට අනුකූලව)

9.1.1 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය.

9.1.2 2013.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය.

9.1.3 2013.12.31 දිනෙන් අවසන් වර්ෂයසඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය.

9.1.4 ගිණුම්කරණ ප්‍රතිපත්ති.

9.2 ජේද 9.1 හි සදහන් පරිදි ආදායම් ප්‍රකාශය,ශේෂ පත්‍රය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සකස් කිරිමට උපයෝගී කරගත් සටහන් ද පැහැදිලිව සටහන් කළ යුතුය.

9.3 ඉන් අනතුරුව, පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශ දිස්ත්‍රික් විගණන අංශයට භාරදිය යුතුය. එම මූල්‍ය ප්‍රකාශන සමග 2013 වර්ෂයේ විගණන කටයුතු සිදුකර දෙන ලෙස කරන ලද ඉල්ලීමක් ද බැංකු මූල්‍ය කටයුතු අංශයේ අධ්‍යක්ෂට පිටපතක් සමග ඉදිරිපත් කළ යුතුය.

9.4 ශේෂ පත්‍ර දිනට අදාල සටහන් හා අදායම් ප්‍රකාශයට අදාල සටහන් යටතේ නව සංකේත අංක හඳුන්වා දී ඇති ගිණුම් පිළිබඳ තොරතුරු සමෘද්ධි වෙබ් අඩවියට අතුළත් කර ඇත.

**10. මාසික බැංකු ප්‍රගති වාර්තා ලබාදීම.**

10.1 සමෘද්ධි බැංකු සංගම් වලින්, 2013 වසර සදහා වර්ෂ අවසාන ගිණුම් පියවීමට කටයුතු සිදු කළ යුතුය. ඒ අනුව ගිණුම් පියවීමට පෙර හා පසු ශේෂ පරික්ෂණය සකස් කිරිම අවසන් කර, සුපුරුදු පරිදි ප්‍රගති වාර්තා හා ශේෂ පරික්ෂණ (පෙර/ පසු) හදුන්වාදී ඇති ආකෘතියට අනුව පරිගණකගත කර සංයුක්ත තැටියක් (CD) මගින් මහ සංගමය වෙත කඩිනමින් ලබාදීම සිදු කළ යුතුය.

**11. මීට අමතරව 2013 වසරේ ගිණුම් පියවීමේ දී බැංකු සංගමයේ පවතින අරමුදල් සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස සියළුම බැංකු වෙත මින් උපදෙස් දෙනු ලැබේ.**

11.1 ආදායම් ගිණුම් හි ශේෂ ලාභ අලාභ ගැලපුම් ගිණුමට මාරු කිරීම.

| | | |
|---|---|---|
| එක් එක් ආදායම් ගිණුම් | - | හර |
| ලාභ අලාභ ගැලපුම් ගිණුම | - | බැර |

11.2 වියදම් ගිණුම් හි ශේෂය ලාභ අලාභ ගැලපුම් ගිණුමට මාරු කිරීම.

| | | |
|---|---|---|
| ලාභ අලාභ ගැලපුම් ගිණුම | - | හර |

එක් එක් වියදම් ගිණුම් - බැර

11.3 ලාභ අලාභ ගැලපුම් ගිණුමෙහි ශේෂය "සංචිත සඳහා වෙන් කිරීමට පෙර වර්ෂය තුල ලාභ අලාභ ගිණුමට" මාරු කිරීම. (මීට අදාලව නව සංකේත අංකයක් යටතේ "සංචිත ගිණුම් සඳහා වෙන් කිරීමට පෙර වර්ෂය තුල ලාභ අලාභ ගිණුම " ලෙසින් නව ගිණුමක් පොදු ලෙජරයේ විවෘත කල යුතුය.)

ලාභ අලාභ ගැලපුම් ගිණුම - හර
සංචිත සඳහා වෙන් කිරිමට පෙර වර්ෂය තුල ලාභ අලාභ ගිණුම - බැර

11.4 සංචිත සඳහා වෙන්කිරිම. ( මේ සඳහා වර්ෂයට අදාල උපරිම ආයෝජන පොලි අනුපාතය හා අවම ආයෝජන පොලි අනුපාතය මත සාමාන්‍ය ආයෝජන පොලි අනුපාතය සැලකිල්ලට ගත යුතු වේ.)

11.4.1 දැනට බැංකු සංගමයේ විවෘත කර ඇති පහත සඳහන් ගිණුම් තෝරා ගෙන එම ගිණුම් වල ආරම්භක (2013.01.01 දිනට ) හා අවසන් (2013.12.31 දිනට) ශේෂයන් එකතු කර එම ශේෂයන් හි සාමාන්‍ය අගයට ඉහත සඳහන් සාමාන්‍ය පොලී අනුපාතය ගණනය කර නව ගිණුමෙන් අදාල ගැලපීම් සිදුකල යුතුය.

4033 - ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් දරන ලද වියදම් සඳහා වෙන් කිරීමේ ගිණුම.
4205 - පොදු සුභ සාධන අරමුදල් ගිණුම.
4208 - කාර්ය මණ්ඩල සුභ සාධනය සඳහා වෙන් කිරිමේ ගිණුම.
4209 - කාර්ය මණ්ඩල පුහුණු විම් සඳහා වෙන් කිරීමේ ගිණුම.

11.4.2 ඡේද අංක 11. 4.1 හි සඳහන් ගැලපිම් සටහන් පහත පරිදි වේ.

සංචිත සඳහා වෙන් කිරිමට පෙර වර්ෂය තුල ලාභ අලාභ ගිණුම -හර

4033 - ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් දරන ලද වියදම් සඳහා වෙන් කිරීමේ ගිණුම
4205 - පොදු සුභ සාධන අරමුදල් ගිණුම.
4208 - කාර්ය මණ්ඩල සුභ සාධනය සඳහා වෙන් කිරිමේ ගිණුම.
4209 - කාර්ය මණ්ඩල පුහුණු විම් සඳහා වෙන් කිරීමේ ගිණුම.
-බැර

11.5 ඉහත 11.3 ඡේදයේ සඳහන් පොදු ලෙජරයේ විවෘත වන නව ගිණුම වන "සංචිත සඳහා වෙන් කිරිමට පෙර ලාභ අලාභ ගිණුමේ" ඉතිරි වන ශේෂය බැංකු සංගමයේ දැනටමත් විවෘත කර ඇති වර්ෂය තුල ලාභ අලාභ ගිණුමට (4302) මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. (කේත අංක 4302 යටතේ අදාල ගිණුම "සංචිත සඳහා වෙන් කිරීමෙන් පසු වර්ෂය තුල ලාභ අලාභ ගිණුම" වශයෙන් සංශෝධනය විය යුතුය.)

4304 සංචිත සඳහා වෙන් කිරිමට පෙර වර්ෂය තුල ලාභ අලාභ ගිණුම - හර
4302 සංචිත සඳහා වෙන් කිරිමෙන් පසු වර්ෂය තුල ලාභ අලාභ ගිණුම - බැර

11.5.1 සංචිත සඳහා වෙන් කිරීමෙන්පසු වර්ෂය තුල ලාභ අලාභ ගිණුමේ ඇති බැර ශේෂය මෙහෙයුම් පත්‍රිකා අංක 12 හා ඊට අදාල එකතුන් හි සඳහන් පරිදි අදාල ගිණුම් වලට විසර්ජනය කිරීමට කටයුතු කළ යුතුය.

4302 - සංචිත සඳහා වෙන් කිරීමෙන් පසු වර්ෂය තුල ලාභ අලාභ ගිණුම - හර

4201 - රඳවාගත් ලාභ අලාභ ගිණුම -50%
4202 - සේවක දිරිදීමනා ගිණුම - 5%
4203 - මහ සංගමයට වෙන්කල අරමුදල් ගිණුම - 5%
4204 - කොටස්කරුවන් සඳහා ගෙවිය යුතු ලාභාංශ ගිණුම -25%
4205 - පොදු සුභ සාධක අරමුදල් ගිණුම - 5%
4206 - සේවක අභිප්‍රේරණය සහ සුභ සාධනය සඳහා වෙන් කිරීමේ ගිණුම - 5%
බැර

4207 - පරිපාලන වියදම් සඳහා වෙන් කිරිමේ ගිණුම - 5%

11.6 වර්ෂය තුල අලාභයක් ලබා ඇති විට

11.6.1 4302 - සංචිත සඳහා වෙන් කිරිමෙන් පසු වර්ෂය තුල ලාභ අලාභ ගිණුම - හර
4301 - ලාභ අලාභ ගැලපුම් ගිණුම - බැර

11.6.2 4201 - රඳවාගත් ලාභ අලාභ ගිණුම - හර
4302 - සංචිත සඳහා වෙන් කිරිමෙන් පසු වර්ෂය තුල ලාභ අලාභ ගිණුම - බැර

## 12. 2014 නව වසරෙහි වැඩ ආරම්භ කිරිම.

12.1 2014 නව වසරෙහි පළමු රාජකාරි දිනය 2014 ජනවාරි මස 01 දිනට යෙදි ඇත. එදින නව වසරෙහි පළමු දින ගණුදෙනු කටයුතු සඳහා සමෘද්ධි බැංකු සංගමය වෙත පැමිණෙන ලෙස ගණුදෙනුකරුවන්ට ආරාධනා කළ යුතුය.

12.2 එදින සිංහල වාරිත්‍ර අනුව දේශිය රසකැවිලි කිහිපයක් සහිත තේ සංග්‍රහයක් එදින බැංකු සංගම් වියදමින් පැවැත්වීමට කටයුතු කළ යුතුය. එම සංග්‍රහය එදින බැංකු සංගමය වෙත පැමිණෙන ගණුදෙනුකරුවන්ට, පාලක මණ්ඩල සාමාජිකයන්ට, වසම්වල සේවය කරන ක්ෂේත්‍ර නිලධාරින්ට සුහදත්වයෙන් පිරිනැමිමට කටයුතු කළ යුතුය. මේ සඳහා රු.2500/-කට යටත්ව බැංකු සංගම් සඳහා වැය දැරීමට හා එම වියදම් වැය ගිණුම - සංග්‍රහ වියදම් යටතේ ගිණුම් තැබීමට අනුමැතිය ලබාදෙමු.

### 12.3 තෛයිපොංගල් දිනය සැමරිම.

හින්දු ජනතාව විසින් භක්තියෙන් සමරන තෛයිපොංගල් උත්සවය 2014 ජනවාරි 14 දින යෙදී ඇත. එම උත්සවය වෙනුවෙන් සිරිත් විරිත් ආගමානුකුලව සමරමින් තැන්පතු ප්‍රවර්ධන වැඩසටහනක් ද ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය උපදෙස් ලබාදෙමු.

## 13. සමෘද්ධි බැංකු සංගම්/ මහ සංගම් සඳහා 2013 දෙසැම්බර් 28 හා 29 දිනයන් රාජකාරි දිනයන් ලෙස නම් කිරිම.

13.1 2013 වසරේ මුල්‍ය ප්‍රකාශන සකස් කිරිම, තැන්පත්කරුවන්ට පොලි ගෙවීම, ශේෂ පිරික්සුම් ලබාගැනීම ආයෝජන කටයුතු ආදිය කඩිනමින් අවසන් කිරිමට 2013 දෙසැම්බර් මස 28 හා 29 සති අන්ත නිවාඩු දිනවල බැංකු සංගම්/මහ සංගම් විවෘත කර රාජකාරිවල නිරතවීමට අවසර දෙනු ලැබේ.

13.2 එම දිනයන් හිරාජකාරිවල නිරත නිලධාරින්ට බැංකු සංගම් වියදමින් දින වැටුප් ලබාගැනීමට අවසර ඇත. මෙම දිනයන් වෙනස් කිරිමට කිසිදු අවසරයක් නැත.

13.3 2014 ජනවාරි 01 දින සිට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුගතවීම සඳහා කටයුතු සිදුකරනු ලබන බැවින්, 2013 දෙසැම්බර් මස 31 දින වන විට වර්ෂ අවසාන ගිණුම් පියවීමේ කටයුතු නිම කිරීමට සියළුම සමෘද්ධි බැංකු සංගම් හා මහ සංගම් හී කාර්ය මණ්ඩල ක්‍රියාකළ යුතුය.

## 14. 2014 වසරට සුබ පැතුම් එකතු කිරිම.

දිළිදුකම අවම කරමින් අඩු ආදායම්ලාභින්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවමින් ආර්ථික සමාජීය, අංශ බල ගැන්විමේ කාර්යයට උරදුන් දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ හා සමෘද්ධි සහකාර කොමසාරිස්/ සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ, දිස්ත්‍රික් සම්බන්ධිකරණ නිලධාරි ඇතුළු දිස්ත්‍රික් සමෘද්ධි අංශයේ කාර්ය මණ්ඩලය, ප්‍රාදේශිය ලේකම්/ නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ හා ගණකාධිකාරි ඇතුළු මූලස්ථාන සමෘද්ධි අංශයේ නිලධාරින්ද, සමෘද්ධි මහ සංගම් හා බැංකු සංගම් කළමනාකරුවන් ඇතුළු කාර්ය මණ්ඩලය ද, වසම්වල සේවයේ නිරත සමෘද්ධි සංවර්ධන නිලධාරින්, විධායක කමිටු හා පාලක මණ්ඩල නිලධාරින් ද, සමෘද්ධි සමිති නිලධාරින් ද, බැංකු සංගම් ජාලය වටා ගොනු වී ඇති ගණුදෙනුකාර භවතුන්ට ද එළැඹෙන 2014 නව වසර ජය හා සතුට පිරුණු සෞභාග්‍යමත් වසරක් උදාවේවායැයි එක සිතින් පතන්නෙමු.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

කේ.කේ.එල්. චන්ද්‍රතිලක,
නි. අධ්‍යක්ෂ - බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම්.